# تعريف بالقرآن الكريم (للحرمين)

# ශුද්ධ වූ අල් කුර්ආනය පිළිබඳ නිර්වචනය

# ශුද්ධ වූ අල් කුර්ආනය පිළිබඳ නිර්වචනය

මස්ජිද් හරාම් හා මස්ජිද් නබවී ආශ්‍රිත ආගමික කටයුතු මූලස්ථාන අධ්‍යයන කමිටුව

## ශුද්ධ වූ අල් කුර්ආනය යනු කුමක් ද?

මස්ජිද් හරාම් හා මස්ජිද් නබවී ආශ්‍රිත ආගමික කටයුතු මූලස්ථාන අධ්‍යයන කමිටුව

අපරිමිත දයාවන්ත අසමසම කරුණාවන්ත අල්ලාහ්ගේ නාමයෙන්

ශුද්ධ වූ අල් කුර්ආනය විශ්ව පරමාධිපති සහ එහි මැවුම්කරු වන අල්ලාහ්ගේ වදන් වේ. උතුමාණෝ එය මිනිස් වර්ගයාට ඔවුන් ව මැවීමේ අරමුණ පැහැදිලි කිරීම සඳහාත් මෙලොව පරලොව ඔවුන්ගේ සැබෑ පරමානන්දය පවතිනා දෑ වෙත ඔවුනට මඟ පෙන්වීම

සඳහාත් මරණින් මතු සදාකාලික දුකින් ඔවුන් මුදවාගැනීම සඳහාත් දේව ධර්ම දූතයින් අතුරින් අවසාන දූතයා වන මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්)තුමාණන් වෙත පහළ කළ සේක. මෙය දෙවිඳාණන් වෙතින් හෙළිදරව් වූ අවසාන දේව ග්‍රන්ථය යි. එමෙන් ම එය පෙර පහළ වූ දෑ සහතික කරන්නක් හා ඒවායෙහි සඳහන් නෛතික ශික්ෂා පිළිවෙත් වෙනස් කරන්නක් ද විය.

ශුද්ධ වූ අල්-කුර්ආනය සදාකාලික ප්‍රාතිහාර්යයක් සහ ආශ්චර්යයක් වන අතර, එය දේව ධර්ම දූත මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්)තුමාණන්ගේ දූතත්වය පිළිබඳ සාක්ෂියකි. හැකිනම්, එවැන්නක් හෝ එහි ඇති පරිච්ඡේදයක් හෝ ගෙන එන මෙන් මිනිස් වර්ගයාට හා ජින් වර්ගයාට එය අභියෝග කර සිටියි. එහෙත් එසේ කිරීමට ඔවුහු අපොහොසත් වූවෝය.

වසර 1400කට පෙර, උතුම් කුර්ආනය හෙළිදරව් වූ දා පටන් විකෘති කිරීමේ සහ වෙනස් කිරීමේ කිසිදු හස්තයකට එය භාජනය වී නොමැත. එය ආරක්ෂා කිරීමේ වගකීම සර්වබලධාරී අල්ලාහ් භාරගත් පරිද්දෙන් ම, එය පහළ වූ අරාබි බසින් ම අවසන් කාලය දක්වා ම සුරක්ෂිත ව පවතිනු නිසැක ය; නිශ්චිත ය.

ශුද්ධ වූ අල් කුර්ආනය ඉස්ලාමයේ ප්‍රධාන මූලාශ්‍රය වන අතර, මිනිස් ජීවිතය නියාමනය කරන හා විධිමත් කරන ව්‍යවස්ථාවකි. එය සෑම කාලයකට ම සහ සෑම ස්ථානයකට ම ඔබින පරිදි මිනිස් ජීවිතවලට මාර්ගෝපදේශයක් වන්නේය. මැවුම්කරුවාණන් වන ඒකීය දෙවිඳාණන්ට පමණක් අවනත වෙමින් නැමදුම් කරන ලෙස ඉල්ලා සිටින අතර තම පරමාධිපතියා, තම දහම, විශ්වය මැවීමේ ආරම්භය සහ මිනිසා මැවීමේ අවධීන් යනාදි මිනිසා විසින් දැනගත යුතු

දෑ එතුළින් මනා ලෙස පැහැදිලි කෙරේ. එමෙන් ම අතීතයේ සහ අනාගතයේ පවතින් ගුප්ත දෑ ගැනත්, පෙර වූ දේව ධර්ම දූතයින් ගැනත්, ඓතිහාසික සිදුවීම් ගැනත්, අල්ලාහ් ඔවුන්ට උදව් කළ ආකාරය සහ ඔවුන්ගේ සතුරන් විනාශ කළ ආකාරය ගැනත් තොරතුරු දන්වා සිටියි. තව ද නැමදුම්වල මූලධර්ම, ගනුදෙනු, ප්‍රශංසනීය ගති පැවතුම් වෙත වූ ඇරයුම, නින්දා සහගත ගති පැවතුම්වලට එරෙහි අනතුරු ඇඟවීම් සහ අවසන් නවාතැන පරලොව බවත් එහි ඇතුළත් වේ. එකී පරලොව නවාතැන දේවත්වය විශ්වාස කරන මුඃමින්වරුන් සඳහා වන ස්වර්ගය වශයෙන් ද, නැතහොත් අපරාධ කරන්නන් සහ දේවත්වය ප්‍රතික්ෂේප කරන්නන් සඳහා වන අපා ගින්න වශයෙන් ද සඳහන් ය.

තව ද අරාබි බසින් අල්ලාහ් පහළ කර ඇති, මනුෂ්‍ය වර්ගයාට මෙහි උත්තුංග පණිවුඩය සැල කරමින් ගෙනහැර

දක්වන ලෙස අණ කර ඇති මෙම ශ්‍රේෂ්ඨ ග්‍රන්ථයේ වැදගත්කම නිසා, අරාබි බසින් උත්තරීතර අල්ලාහ් පහළ කළා වූ මෙම උතුම් කුර්ආනයෙහි ගැඹුරු අවබෝධය පහසු කර ගැනීමට සහ එකී පණිවුඩය සැල කරමින් ප්‍රචාරය කිරීමේ කර්තව්‍යය සාක්ෂාත් කර ගැනීම සඳහා (පාඨක) ඔබේ භාෂාවෙන් එහි අරුත් හා අදහස් අපගේ කණ්ඩායම පරිවර්තනය කිරීම ගැන අපි සතුටු වෙමු. පරිවර්තනය කෙතරම් නිවැරදි වුවත්, එම අරාබි පාඨවලින් හෙළිදරව් වූ උතුම් කුර්ආනයේ ආශ්චර්යමත් විශිෂ්ට භාෂාමය අර්ථකතනය වෙනත් ඕනෑ ම භාෂාවකින් ඉදිරිපත් කිරීමට අපොහොසත් බව නිසැක ව ම දන්නා නමුත්, පරිවර්තන කාර්ය සිදු කරන කණ්ඩායම එහි අර්ථය තේරුම් ගැනීමට සහ මූල පාඨවලට වෙනස් නොවන අදහස පරිවර්තනය කිරීම සඳහා සෑම උත්සාහයක් ම ගෙන ඇත. එම නිසා

ශුද්ධ වූ අල්කුර්ආනය පහළ කරනු ලැබූ අරාබි භාෂාව ඔබත් ඉගෙන ගන්නා ලෙස අපි උපදෙස් කරමින් නිර්දේශ කරමු.

දේව ධර්ම දූතයින් කෙරෙහි අල්ලාහ්ගේ ශාන්තිය හිමි වේවා! සියලු ප්‍රශංසා විශ්ව පරමාධිපති වන අල්ලාහ්ට ම හිමි ය.

මෙම (QR) තීරු කේතය හරහා, ඔබට ඔබේ භාෂාවෙන් ශුද්ධ වූ අල් කුර්ආන් අර්ථකථනය දැක ගත හැකි ය.

# පටුන

ශුද්ධ වූ අල් කුර්ආනය පිළිබඳ නිර්වචනය ................................ 2
ශුද්ධ වූ අල් කුර්ආනය යනු කුමක් ද? ............................................ 2

si445v1.2 - 06/09/2026